# විදේශ සම්පත් දෙපාර්තමේන්තුව
## வெளிநாட்டு வளங்கள் திணைக்களம்
## Department of External Resources

මුදල් අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය (3 වැනි මහල), තැ.පෙ. 277, කොළඹ 00100, ශ්‍රී ලංකාව

நிதி அமைச்சு
செயலகம் (3 ஆம் மாடி), த. பெ. இல. 277, கொழும்பு 00100, இலங்கை

Ministry of Finance
The Secretariat (3rd Floor), P.O. Box 277, Colombo 00100, Sri Lanka

**Web Site**:www.erd.gov.lk **e-mail:** info@erd.gov.lk


## මාධ්‍ය නිවේදනය

## සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ අතිරේක මූල්‍යකරණය සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙන් ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 110 ක මූල්‍යාධාර

"සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ අතිරේක මූල්‍යකරණයක් ලෙස ශ්‍රී ලංකා රජය විසින් ආසියානු සංවර්ධන බැංකුවෙන් (ADB) ඇමරිකානු ඩොලර් මිලියන 110 ක ණය මුදලක් හා ආසියානු සංවර්ධන බැංකුව විසින් කළමනාකරණය කරනු ලබන දරිද්‍රතාවය අවම කිරීම සඳහා වූ ජපන් අරමුදල මගින් ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 03 ක මුදලක් ප්‍රදානයක් ලබා ගැනීමට තීරණය කොට තිබේ.

2020 වර්ෂයේ මුල් භාගයේදී, කොවිඩ් -19 වසංගතයේ පැතිර යාමත් සමඟ, දැනට ක්‍රියාත්මක වෙමින් පවතින සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියෙන් (HSEP) ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් (ඇ.එ.ජ.ඩොලර්) මිලියන 15 ක්, අණුක ජීව විද්‍යාගාරවල ධාරිතාව ඉහළ නැංවීම, රෝහල්වල හදිසි අවස්ථා සඳහා වූ වෛද්‍ය උපකරණ සඳහා ප්‍රවේශය ඉහළ නැංවීම, දැඩි සත්කාර ඒකක පහසුකම් පුළුල් කිරීම, සායනික මුහුණු ආවරණ, පෞද්ගලික ආරක්ෂක උපකරණ හා ප්‍රතිකාරක වැනි ද්‍රව්‍ය ලබා ගැනීමට ඇති හැකියාව වැඩි කිරීම සහ පොලිමරේස් දාම ප්‍රතික්‍රියා (PCR)) පරීක්ෂාව හා COVID-19 හඳුනාගැනීමට අදාළ වන උපකරණ ලබා ගැනීම වැනි හදිසි අවශ්‍යතා සඳහා යොදා ගන්නා ලදී.

මෙම අතිරේක මූල්‍යකරණය මගින් ලැබෙන අරමුදල් කොවිඩ් -19 වසංගතයේ තුන්වැනි රැල්ල කළමනාකරණය කිරීම පිණිස වූ රජයේ හදිසි මූල්‍ය අවශ්‍යතා සඳහා ප්‍රතිපාදන සපයා ගැනීමට මෙන්ම දැනට සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතින සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ ප්‍රාථමික සෞඛ්‍ය සේවා සංවර්ධනයට සම්බන්ධව කලින් සැලසුම් කළ කටයුතු සම්පූර්ණ කිරීම සඳහා යොදා ගැනීමට නියමිතය.

සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය හා ඒ සඳහා අතිරේක මූල්‍යකරණය මගින් එක්කරන ලද වැඩසටහන් මගින් ජාතියේ නිරෝගීමත්


| අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General | 94-11-2484693 | කාර්යාලය / அலுவலகம் / Office | 94-11-2484500<br>94-11-2484600 | ෆැක්ස් / අංකය / தொலை நகல் / Fax | 94-11-2447633<br>94-11-2387153<br>94-11-2434876 |
|---|---|---|---|---|---|

භාවය තහවුරු කරන අතරම කෝවිඩ් - 19 වසංගත තත්වය පාලනය කිරීම සඳහා අවශ්‍ය සහය ලබා දෙනු ලබයි.

ශ්‍රී ලංකා රජය මගින් දායක වනු ලබන ඇ.එ.ජ.ඩොලර් මිලියන 10 ද ඇතුළත්ව මුළු ඇස්තමේන්තුගත ව්‍යාපෘති පිරිවැය ඇ.එ.ජ.ඩොලර් මිලියන 123 ක් වන අතර ව්‍යාපෘතිය 2025 නොවැම්බර් මස 30 වැනි දිනෙන් අවසන් වීමට නියමිතය.

පිළිවෙලින් ඇ.එ.ජ.ඩොලර් මිලියන 110 ක ණය මුදලක් හා ඇ.එ.ජ.ඩොලර් මිලියන 3ක ප්‍රදාන මුදලක් ලෙස වන සෞඛ්‍ය පද්ධති වැඩිදියුණු කිරීම සඳහා වූ අතිරේක මූල්‍යකරණය සඳහා වන ණය ගිවිසුම හා ප්‍රදාන ගිවිසුම ශ්‍රී ලංකා රජය වෙනුවෙන් මුදල් අමාත්‍යාංශ ලේකම් එස්. ආර්. ආටිගල මහතා සහ ආසියානු සංවර්ධන බැංකු ශ්‍රී ලංකා නේවාසික අධ්‍යක්ෂ **චෙන් චෙන්** මහතා විසින් 2021 ඔක්තෝබර් මස 07 දින අත්සන් තැබීය.